**ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල .**

(අ) තමන්කඩුව

(ආ) හිඟුරක්ගොඩ .

(ඇ) මැදිරිගිරිය

(ඈ) ලංකාපුර

(ඉ) දිඹුලාගල

(ඊ) වැලිකන්ද

(උ) ඇලහැර

**1.2 විගණන විෂය පථය**

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 අගෝස්තු 21 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. ගිණුම්

2.1 විසර්ජන ගිණුම

(අ) මුළු ප්‍රතිපාදන හා වියදම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 453.26 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 442.58 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 10.68 ක් හෙවත් සියයට 2.36 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** රු. | **රු.මිලියන** රු. | **රු.මිලියන** රු. | |
| පුනරාවර්තන | 367.36 | 357.47 | 9.89 | 2.69 |
| මූලධන | 85.90 | 85.11 | 0.79 | 0.92 |
| **එකතුව** | **453.26** | **442.58** | **10.68** | **2.36** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 23 ක් හා දෙපාර්තමේන්තු 17 කින් පිළිවෙලින් රු.මිලියන 1,549.17 ක් හා රු.මිලියන 601.71 ක් වශයෙන් එකතුව රු.මිලියන 2,150.88 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළිවෙලින් රු.මිලියන 1,483.72 ක් හා රු.මිලියන 578.60 ක් වශයෙන් එකතුව රු.මිලියන 2,062.32 ක

ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව පිළිවෙලින් රු.මිලියන 65.41 ක් හා රු.මිලියන 23.11 ක් වශයෙන් එකතුව රු.මිලියන 88.52 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

2.2 අත්තිකාරම් ගිණුම්

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 27501 | 27.00 | 19.40 | 15.00 | 15.83 | 106.00 | 79.80 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පත් ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.252,185,292 ක් විය.

2.4 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරික්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරික්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

3. ශීර්ෂය - 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 ක් විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර මුදල් රෙගුලාසි 565(1) ප්‍රකාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ලෙජරය යාවත්කාලීන කර නොතිබුණි.

| | කාර්යාලය | ලේඛන වර්ගය | අදාල රෙගුලාසි |
|---|---|---|---|
| (i)<br>(ii)<br>(iii) | වැලිකන්ද ,දිඹුලාගල,<br>ලංකාපුර,හිඟුරක්ගොඩ,<br>ඇලහැර හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iv) | ලංකාපුර,හිඟුරක්ගොඩ, ඇලහැර හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (v) | තමන්කඩුව,ලංකාපුර හා ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාල | විගණන විමසුම් ලේඛනය | මුදල් රෙගුලාසි 452(I) |
| (vi) | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 |
| (vii) | වැලිකන්ද,දිඹුලාගල, ඇලහැර, හිඟුරක්ගොඩ, මැදිරිගිරිය, ලංකාපුර හා තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(I) |
| (viii) | සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | දුරකථන ඇමතුම් ලේඛනය | මුදල් රෙගුලාසි 850(1) ප්‍රකාර 29 වැනි පරිශිෂ්ඨය |
| (ix) | තමන්කඩුව,දිඹුලාගල, ලංකාපුර, හිඟුරක්ගොඩ, ඇලහැර, මැදිරිගිරිය හා වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (x) | තමන්කඩුව, වැලිකන්ද, දිඹුලාගල, ලංකාපුර හිඟුරක්ගොඩ, ඇලහැර හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

| | | | |
|---|---|---|---|
| (xi) | දිස්ත්‍රික්ලේකම් කාර්යාලය හා සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (xii) | සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) |
| (xiii) | තමන්කඩුව, දිඹුලාගල, ලංකාපුර, හිඟුරක්ගොඩ, ඇලහැර හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |
| (xiv) | ලංකාපුර, හිඟුරක්ගොඩ, ඇලහැර, මැදිරිගිරිය, තමන්කඩුව හා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය |

**3.2 විසර්ජන ගිණුම**
**-------------------**
**අයවැය විචලනය**
**--------------------**
**පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.**

(අ) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.30,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 10 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 ක සිට සියයට 74 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි

3.3 පොදු තැන්පත් ගිණුම
------------------------
පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද සැසඳුම් ප්‍රකාශයට අනුව 2014 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.157,903,222 ක් වී තිබුණි. එදිනට කේවල ශේෂ වාර්තාව අනුව ශේෂ එකතුව රු.157,948,171 ක් වී තිබුණි. ඒ අනුව රු.44,949 ක වෙනසක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවැත එන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රු.57,440,444 ක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක එකතුව රු. 402,155 ක තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව

කටයුතු කර නොතිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කල් ඉකුත් වූ තැන්පතුවලින් රු.57,246,042 ක් වූ තැන්පතු රාජ්‍ය සංස්ථාවක් විසින් කර තිබුණු තැන්පතුවක් විය.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 27501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,210,130 ක් වූ අතර එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 14 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත් එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5 උප වගන්තියට අනුව මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.254,645 ක් වූ ණය ශේෂය, අවුරුදු 10 කට අධික කාලයක් මුළුල්ලේ නිරවුල් නොකර පරිශේෂව පැවැතුණි.

(ඇ) වර්ෂ 1 ක සිට වර්ෂ 8 ක් දක්වා කාල පරාසයක් මුළුල්ලේ හිඟහිටව පැවති රු.290,405 ණය ශේෂ 05 ක් සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කර තිබුණත්, එම ශේෂයට අදාළව හිඟහිටිව පැවැති කාලය තුළ එම ණය ශේෂයට අදාළ පොළිය අයකර ගෙන නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් ඌනතාවයන් අනාවරණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය | |
|---|---|---|---|---|
| | | | වර්ෂ 01 ට වැඩි 3 ට අඩු | වර්ෂ 3 ට වැඩි |
| | | | ඒකක | ඒකක |
| (i) | ගොඩනැගිලි | 02 | - | 02 |
| (ii). | මෝටර් වාහන | 10 | 01 | 09 |
| (iii). | යන්ත්‍ර සූත්‍ර | 23 | 22 | 01 |
| (iv). | වෙනත් වත්කම් - පාපැදි (කාන්තා) | 01 | - | 01 |
| (v) | - ආර්ථික සංවර්ධන - නිල නාම පුවරු | 35 | 35 | - |
| (vi) | - White Board | 25 | 25 | - |

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණනය වෙත ඉදිරිපත් කළයුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක් විසින් දින 02 ක සිට දින 120 ක් දක්වා පරාසයක කාලයක් ප්‍රමාද කර විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

බාහිර පාර්ශවයන් වෙත ලබා දි තිබුණු වත්කම් පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රුපියල් මිලියන 2 ක් වටිනා හෙක්ටයාර් 0.1548 ක ඉඩම හා ගොඩනැගිල්ල වසරකට අධික කාලයක සිට කම්කරු දෙපාර්තමේන්තුවට ලබාදී තිබුණි.

(ii) හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ආපසු භාරදීමේ පදනම මත නිකුත් කර තිබුණු ලීටර් 1000 ජල ටැංකි 110 ක් විවිධ සංවිධාන හා ආයතනවලට ලබාදි වසර ගණනාවක් ගතවී තිබුණද, එම ජල ටැංකි ආපසු ලබාගැනීමට හෝ ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කිරිමක් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදුකර නොතිබුණි.

3.6 අනුකූල නොවීම්

--------------------

නීති,රීති හා රෙගුලාසිවලට  අනුකූල නොවීම

--------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) මෝටර් වාහන පනතේ 203 අධිකාරිය 25.1 වගනිත්ය හා 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පීඑෆ්/437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - | ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යලය විසින් භාවිතා කරනු ලබන වාහනයක් සඳහා ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබාගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| XII පරිච්ඡේදයේ 1.2 වගන්තිය | - | නිවාඩු ඉල්ලුම් පත්‍රයක් නිවාඩුව ආරම්භ වන දිනට යටත් පිරිසෙන් දින හතකටවත් කලින් නිවාඩු අනුමත කරන නිලධාරියාගේ කාර්යාලයට ලැබිය යුතු වුවද, පොදු 125 ආකෘති පත්‍රයක් මගින් නිවාඩු ඉල්ලුම් කර හෝ නොමැතිව තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් 17 දෙනෙකු විසින් දින 187 ක් නිවාඩු  ලෙස ලබාගෙන තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි  115 | 11,816 | පොළොන්නරුව දිස්ත්‍රික්  ලේකම් කාර්යාලය විසින්  ඉකුත් වර්ෂය වෙනුවෙන් සිදු කළ ගෙවීම් සඳහා  මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි  225(4) | - | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවීම් කළ වවුචර්වල එය පිළියෙල  කළ හා නිරවද්‍යතාවය පරීක්ෂා  කළ නිලධාරින් විසින් වවුචර්වල අදාල ස්ථානයේ අත්සන් කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. |
| (iv) මුදල් රෙගුලාසි 237(අ)(iii) | 2,213,442 | පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වැඩය නිමකර මනා තත්ත්වයෙන් ඇති බවටත්, නියාමනයන් හා කොන්දේසි සම්පූර්ණයෙන් සපුරා ඇති බවටත් තාක්ෂණ නිලධාරී සහතිකයක් ලබා නොගෙන අත රඳවාගත් මුදල් නිදහස් කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (v) | මුදල් රෙගුලාසි 371 | 1,779,500 | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවස්ථා 19 කදී විවිධ කාර්යයන් සඳහා නිලධාරීන් වෙත ලබාදුන් අත්තිකාරම්, එම නිලධාරීන් විසින් මාස 2 ක සිට 7 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. |
| (vi) | මුදල් රෙගුලාසි 880(1) හා 881(1) | - | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඇප ලබා තැන්පත් ලබා ගත යුතු නිලධාරීන්ගෙන් අදාල ඇප මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (vii) | මුදල් රෙගුලාසි 702(3) | | දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කර තිබුණු කිසිදු ව්‍යාපෘතියක ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

-----------------------------------------

| | | | |
|---|---|---|---|
| (i) | 2.14.1 මාර්ගෝපදේශය | - | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රසම්පාදන 5 ක් සඳහා ලංසු කඳවා තිබුණි. එම එක් එක් ප්‍රසම්පාදනය එක් ලංසුවක් පමණක් ඉදිරිපත් වී තිබුණු අතර ඒ මත ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමේ තීරණයට එළඹ තිබුණි. මිල සැසඳුම් ක්‍රමය යටතේ ලංසුකරුවන්ට ප්‍රසම්පාදන ඉල්ලුම්පත් ලියාපදිංචි තැපැලෙන් යැවූ බව සනාථ කිරීමට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | 5.4.4 මාර්ගෝපදේශය | 3,500,000 | පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු කොන්ත්‍රාත් සඳහා අත්තිකාරම් ගෙවීමේදී, අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණ ලබා ගෙන නොතිබුණි. |
| (iii) | 6.3.3. (ආ) මාර්ගෝපදේශය | - | ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලංසු වැසීමත් සමඟ හැකිතාක් ඉක්මනින් ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කළයුතු වුවද, ලංසුකරුවන් වෙත ලංසු විවෘත කිරීමේ අවස්ථාව අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

**3.7 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පළාත් නැගුම වැඩසටහන යටතේ ගල්ලැල්ල සමඩ් මහතාගේ නිවස අසල හරස් මාර්ගයට කුඩා පාලමක් ඉදිකිරීම සඳහා රු.100,000 කට ඇස්තමේන්තු කළ ව්‍යාපෘතිය පැවති අයහපත් කාලගුණික හේතූන් මත 2014 වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වනජීවි හා වන රොද සංරක්ෂණ වැඩසටහන - යටතේ දීප උයන සංවර්ධන ව්‍යාපෘතිය 2014 වර්ෂයේදී ක්‍රියාත්මක කිරිම සඳහා රු.30,800,535 ක් ඇස්තමේන්තු කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ අනුමැතිය නොලැබීම නිසා එම ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. රජය විසින් එම ව්‍යාපෘතිය සඳහා රු.1,350,418 ක් වැය කර තිබුණි.

**(ඇ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

ප්‍රතිපාදන සළසා තිබුණත් පහත සඳහන් ව්‍යාපෘතිවල ප්‍රගතියක් අත්කර ගැනීමට නොහැකි වි තිබුණු බව නිරීක්ෂණය විය.

(i) වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 විමධ්‍යගත වැඩසටහන යටතේ කඩවත්මඩුව පංචශීලී වැඩිහිටි ප්‍රජා ශාලාව ඉදිකිරීම සඳහා රු.50,000 ක් ගෙවා තිබුණි. නමුත් අදාල ප්‍රජා ශාලාව ඉදිකිරීමට නිශ්චිත ඉඩමක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලබාගෙන නොතිබුණි.

(ii) වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ බෞද්ධ මධ්‍යස්ථානයක් සඳහා රු.210,000 ක ද්‍රව්‍යමය ආධාර ලබාදී තිබුණි. එම ආධාරවලින් කිසිදු ඉදිකිරිමක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සිදු කර නොතිබුණි.

(iii) ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විමධ්‍යගත අයවැය විශේෂ ව්‍යාපෘති යටතේ අල් හජිහා කාර්ය සංවිධානය සඳහා ප්‍රජා ශාලාවක් ඉදිකිරිම සඳහා රු.72,750 ක් වටිනා ද්‍රව්‍යමය ආධාර ලබාදී තිබුණි. එවැනි ප්‍රජා ශාලාවක් ඉදිකිරිම සඳහා නිශ්චිත ඉඩමක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලබා ගෙන නොතිබුණි.

3.8 අවිධිමත් ගනුදෙනු

---------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

------------------------------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදුකර තිබුණු ඇතැම් ප්‍රසම්පාදන කටයුතු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) ඇලහැර හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අඩු වටිනාකමකින් යුත් අයිතමයන් ප්‍රසම්පාදනය කිරිම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම එම අයිතමයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනය හෝ දුරකථන නාමාවලිය හෝ මිල ගණන් කැඳවීමට භාවිතා කර ගෙන නොතිබුණි.

(ii) හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාතෘ සායන මධ්‍යස්ථානයකට අවශ්‍ය උපකරණ මිලදී ගෙන තිබුණද, ඒ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක සහය ලබාගෙන නොතිබුණි.

(iii) 2013 පෙබරවාරි 12 දිනැති අංක 13/0198/540/004 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් කරුණුවලට පටහැනිව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2012/13 මහ කන්නයේදී ගොවීන්ගෙන් මිලදීගත් වී තොග විකිණීමේදී අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශ ලේකම්වරයාගේ මැදිහත්වීමකින් තොරව සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.

(iv) 2013 ජූලි 17 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 6.3 ඡේදය අනුව, 2012/13 මහ කන්නයට අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වී තොග අලෙවි කිරීමේදී පිළිගත් ප්‍රසම්පාදන පරිපාටීන් අනුගමනය කර නොතිබුණි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ එක් පුද්ගලික සමාගමක් විසින් 2013 ජූලි 23 දින දිස්ත්‍රික් ලේකම්වරයාට එවන ලද ෆැක්ස් පත්‍රයේ සඳහන් මිල පදනම් කරගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු කිලෝ 7,941,149 ක්වූ සම්පූර්ණ වී තොගය රු.250,192,608 කට අලෙවි කර තිබුණි.

(ආ) බිත්තර වී සඳහා මුදල් ගෙවීම

---------------------------------

2014 වර්ෂයේ බිත්තර වී සඳහා ගෙවීම් කිරීමට 243-110-2502-2 වැය විෂය යටතේ ප්‍රතිපාදන ලැබී තිබුණි. එම ප්‍රතිපාදන උපයෝගී කරගෙන චෙක්පත් මගින් අදාල

පාර්ශවයන් වෙත මුදල් ගෙවා තිබුණි. එසේ ගෙවීම් කිරීමේදී චෙක්පත් නිකුත් කිරීමේ ලේඛනයේ අදාළ ආදායකයන් හඳුනාගත් බව තහවුරු කළ බව සනාථ කිරිම සඳහා ජාතික හැඳුනුම්පතෙහි අංකය හා චෙක්පත් ලබාගත් බවට අත්සන් හෝ නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

**(ඇ) චෙක්පත් නිකුත් කිරීම**

--------------------------

මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ චෙක්පත් ලිවීමේ හා නිකුත් කිරිමේ කාර්යයයෙහි නිරත විෂයභාර ලිපිකාරිනිය අත තිබුණු චෙක්පත් 56 ක් විගණනය වෙත ඉදිරිපත් කරන ලදී. මෙම චෙක්පත් 56 ක්ම හිස් චෙක්පත් වූ අතර ඒවා නිකුත් කිරීමට ගණකාධිකාරිවරයා විසින් කටයුතු කර නොතිබුණි. මේ තුළින් මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ චෙක්පත් නිකුත් කිරීමේ ක්‍රියා පටිපාටියේ අභ්‍යන්තර පාලනය දුර්වල වී තිබුණි.

3.9 පාඩු හා හානි

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2014 ජුනි 26 දින අනතුරකට භාජනය වීමෙන් රු.187,750 ක අලාභයක් සිදු වී තිබුණි. එම අනතුර සම්බන්ධයෙන් රක්ෂණ ආයතනයක් විසින් රු.115,621 ක් ලැබී තිබුණි. ඉතිරි රු.72,123 ක අලාභය අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2010 ජුලි 25 දින අනතුරකට පත්ව තිබුණි. ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර ලබා දී තිබුණු පරික්ෂණ මණ්ඩල වාර්තාව අනුව අනතුරට වගකිව යුතු හිටපු ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් රු.230,000 ක අදාල අලාභය අය කර යුතුව තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාරියාලය විසින් එම අලාභය 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. එම රථය අළුත්වැඩියාවකින් තොරව 2015 ජූලි මාසය වන විටත් වර්ෂ 5 ක කාලයක් මුළුල්ලේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රථගාලේ ගාල්කර තිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාල වාහන 07 ක් අනතුරුවලට පත්වී වසර 1 ක සිට වසර 4 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, 2015 ජුනි 18 දින වන විටත් එම අනතුරුවලට අදාල පරීක්ෂණ නිමකර නොතිබුණි.

(ඈ) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හිටපු ප්‍රාදේශීය ලේකම් වෙත රාජකාරී කටයුතු සඳහා නිකුත් කර තිබුණු Toshiba වර්ගයේ ලැප්ටොප් පරිගණකය නිල

නිවාසයේදී සොරකම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාර ප්‍රාරම්භක වාර්තාව හා පූර්ණ වාර්තාවක් ලබා ගෙන නොතිබුණි.

3.10 කළමනාකරණ දුර්වලතා
------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක බල ප්‍රදේශයේ රජයේ ඉඩම්වල පදිංචිව සිටින වගා කටයුතුවල නියුතු ගොවීන් වෙත නිකුත් කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් අත්සන් කරන ලද දීමනා පත්‍ර 1,266 ක් ලබා දි තිබුණි. එම ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ඉඩම් අංශවල වසර ගණනාවක් මුළුල්ලේ එම දීමනා පත්‍ර අදාල ගොවීන් වෙත භාර නොදී රඳවා ගෙන තිබුණි.

(ආ) හිගුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොවීන් වෙත භාර නොදී තිබුණු දීමනාපත්‍ර 625 අතුරින් දීමනාපත්‍ර 120 ක් ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයේ ලියාපදිංචි කර තිබුණි.

(ඇ) මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීමනා පත්‍ර නිකුත් කිරීමේ ලේඛනයෙහි දීමනාපත්‍ර භාරගත් පාර්ශවයන්ගේ නම, අත්සන හා දිනය යොදා නොතිබුණි. මේ හේතුවෙන් දීමනාපත්‍ර සත්‍ය වශයෙන්ම අදාල පුද්ගලයාට ලැබුණේද යන්න පිළිබදව තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය.

(ඈ) මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන නිලධාරීන් 8 දෙනෙකු නිවාඩු ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේදී නිවාඩු ලබා ගෙන නොතිබුණි. එම නිලධාරීන් අතරින් බොහෝ දෙනෙකු ක්ෂේත්‍ර නිලධාරීන් බව අනාවරණය විය. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ පැමිණීම හා නිවාඩු ලබා ගැනීමේ පාලනය දුර්වල වි ඇති බව විගණනයේදී අනාවරණය විය.

(ඉ) ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2014 වර්ෂයේ විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ ලංකාපුර සේවා පියස ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීම සඳහා රු.49,265 ක් වටිනා ද්‍රව්‍යමය ආධාර ලබා ගෙන තිබුණි. එම ආධාර අදාළ කාර්යයට උපයෝජනය නොකර කාර්යාලීය ගබඩාව තුළ රඳවා තිබුණි.

(ඊ) ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 3 වගන්තිය අනුව සියළු රජයේ නිවාස ශ්‍රේණිගත කළ යුතු වුවත්, ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එලෙස රජයේ නිවාස ශ්‍රේණිගත කර නොතිබුණි. එම නිවාසවල නිලධාරීන් දෙදෙනෙකු වර්ෂ

05 කට වඩා වැඩි කාලයක් මුළුල්ලේ පදිංචිවී සිටින නමුත් බදු කාලය දිර්ඝ කිරීමක් සිදුකර නොතිබුණි.

(උ) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සමෘද්ධි බැංකු සංගම් 05 ක් තුළ 2014 දෙසැම්බර් 31 දිනට රු.4,861,227 ක අක්‍රීය බැංකු ගිණුම් 7835 ක් පැවැතුණි.

(ඌ) උපලේඛනගත නොවන අනෙකුත් සියළුම රජයේ නිවාසවල බදු කාලය වසර 05 කට සීමා කර තිබුණත්, එම කාලය ඉක්මවා පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාසවල නිලධාරීන් 08 දෙනෙකු පදිංචි වී සිටින බව අනාවරණය විය.

(එ) අළුත්වැව දිවුලපිටිය ගංවතුර පාලන ආරක්ෂණ බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම, වාරි කර්මාන්ත විෂය පථයට අදාල ව්‍යාපෘතියක් වී තිබුණි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු හෝ තාක්ෂණ නිලධාරීන්ගේ උපදෙස්, මඟපෙන්වීමකින් හා අධීක්ෂණයකින් තොරව සිවිල් තාක්ෂණ නිලධාරියෙකු විසින් සකස් කළ ඇස්තමේන්තුවක් හා අධීක්ෂණයක් යටතේ කර්මාන්තය ඉටුකර තිබුණි. නමුත් එම ව්‍යාපෘතිය නිසි ප්‍රමිතිගත තත්ත්වයකින් ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.11 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2014 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 21 | 08 |
| (ii) | තෘතීයික මට්ටම | 39 | 14 | 25 |
| (iii) | ද්විතීයික මට්ටම | 618 | 510 | 108 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 94 | 89 | 05 |
| | එකතුව | 780 | 634 | 146 |